මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වල පවතින අ.පො.ස. (උසස් පෙළ) ගණිතය, විද්‍යාව, තාක්ෂණවේදය, විදේශ භාෂා හා විශේෂ අධ්‍යාපනය යන විෂයයන්වල පුරප්පාඩු සඳහා උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීම 2023

මධ්‍යම පළාතේ පළාත් සභා පාසල්වල පවතින අ.පො.ස (උසස් පෙළ) ගණිතය, විද්‍යාව, තාක්ෂණවේදය, විදේශ භාෂා හා විශේෂ අධ්‍යාපන විෂයයන්වල පවතින පුරප්පාඩු සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් සපුරා ඇති මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි උපාධිධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ සාමාන්‍ය සුදුසුකම්

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
ii. මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතුය.
iii. යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.
iv. 2023.09.08 දිනට පූර්වාසන්න වසර 03 ක් මධ්‍යම පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
- මධ්‍යම පළාතේ පූර්වාසන්න වසර 03 ක හෝ ඊට වැඩි ස්ථිර පදිංචියක් ඇති අයෙකු සමග විවාහවූකුලව වීවාහ වී මධ්‍යම පළාතේ ස්ථිර පදිංචියට පැමිණි අයටද පදිංචිය සනාථ කෙරෙන ලිඛිත සාක්ෂි මත ඉල්ලුම් කළ හැක.

v. 2023.09.08 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

02. අධ්‍යාපන සුදුසුකම්

i. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2023.09.08 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ ප්‍රදානය කරනු ලැබූ උපාධියක් ලබා තිබිය යුතු අතර, මෙම දන්වීමෙහි උපලේඛන 01 හි සඳහන් කර ඇති එක් එක් විෂයයන් සඳහා අයදුම්කිරීමට අදාළව ලබා තිබිය යුතු උපාධි පිළිබඳ තොරතුරු මෙම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය වන www.cm.cp.gov.lk හි පළකර ඇත.

සහ

ii. අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 3 ක් (පොදු පරීක්ෂණය හැර) සහිතව එම විභාගය සමත්ව තිබිය යුතුය.

සහ

iii. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව අ.පො.ස. (සා.පෙ) විභාගයේදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව සහිතව විෂයයන් හයකින් සමත්ව තිබිය යුතුය.

සැලකිය යුතුය

- අයදුම්පත් කැඳවීමේ අවසන් දිනයට නිවේදනයේ සඳහන් සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.
- ඉහත බඳවා ගැනීමේ මූලික සුදුසුකම් හා අධ්‍යාපන සුදුසුකම් නොමැති අය ඉල්ලුම් නොකරන ලෙස විශේෂයෙන් සඳහන් කරන අතර එවැනි ඉල්ලුම් පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ.

උපලේඛන අංක 01

පහත විෂයයන්ට අදාළ පාසල් ගත පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

විෂය කේත අංකය	විෂය	මාධ්‍යය		
		සිංහල	දෙමළ	ඉංග්‍රීසි
01	රසායන විද්‍යාව	✓	✓	✓
02	භෞතික විද්‍යාව	✓	✓	✓
03	ජීව විද්‍යාව	✓	✓	✓
04	කෘෂි විද්‍යාව	✓	✓	✓
05	සංයුක්ත ගණිතය	✓	✓	✓
06	ඉංජිනේරු තාක්ෂණවේදය	✓	✓	
07	ජෛව පද්ධති තාක්ෂණවේදය	✓	✓	
08	තාක්ෂණවේදය සඳහා විද්‍යාව	✓	✓	✓
09	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	✓	✓	✓
10	ඉංග්‍රීසි	✓		✓
11	අරාබි		✓	
12	ප්‍රංශ	✓		
14	ජපන්	✓		✓
15	ජර්මන්	✓		
18	හින්දි	✓		
19	ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය	✓		
20	සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය	✓	✓	
21	ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා	✓	✓	
22	ප්‍රාසාංගික කලාව	✓	✓	
23	කාර්ය සිද්ධි කළමනාකරණය		✓	
24	ශිල්ප කලා	✓	✓	
25	අභ්‍යන්තර නිර්මාණකරණය	✓	✓	
26	විලාසිතා නිර්මාණකරණය	✓	✓	
27	ග්‍රැෆික් නිර්මාණකරණය	✓	✓	
28	වාණිජ්‍ය උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය	✓	✓	
29	පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය		✓	
30	ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය	✓	✓	
31	ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය	✓		
32	වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය	✓	✓	
33	ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය	✓	✓	
34	මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය	✓	✓	
35	විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය	✓	✓	
36	පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය		✓	
37	ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය		✓	
38	ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය	✓	✓	
39	පරිගණක දෘඩාංග සහ ජාලකරණය	✓	✓	
41	සංචාරක හා ආගන්තුක සත්කාර	✓	✓	
42	අලෙවිකරණය	✓		
43	විශේෂ අධ්‍යාපනය	✓	✓	

03. අයදුම් කිරීමේ ක්‍රමය

i. අයදුම්පත්‍රය මෙම නිවේදනයේ පළකර ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව සකස් කළ යුතුය.
ii. එය A-4 ප්‍රමාණයේ කඩදාසියක 01 සිට 17 තෙක් වන ශීර්ෂ පළමු පිටුවේ ද 18 සිට 33 තෙක් ශීර්ෂ දෙවන පිටුවේ ද 34 සිට 35 තෙක් වන ශීර්ෂ තෙවන පිටුවෙහිද වන පරිදි අයදුම්පත්‍රය සකස්කර අපේක්ෂකයා විසින්ම පිරවිය යුතුය.
iii. රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ රු. 32,960/- ක මාසික ආරම්භක මූලික වැටුපක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියකු විසින් අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන සහතික කරනු ලැබ තිබිය යුතුය.
iv. පහත සඳහන් ලේඛනවල පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.
1. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්
2. 2023.09.08 දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කරන ලද උපාධි සහතිකයේ ඡායා පිටපතක්
3. උපාධි පාඨමාලාව සාර්ථකව නිමකිරීමෙන් පසු ලබා දෙන ලද විෂයයන් සහ විලංගු දිනය සඳහන් විස්තරාත්මක සහතිකයේ ඡායා පිටපත

v. නිවැරදිව සම්පූර්ණ කරනලද අයදුම්පත්‍රය 2023.09.08 දිනට හෝ ඊට පෙර "**ලේකම්, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ**" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වල පවතින අ.පො.ස. (උසස් පෙළ) ගණිතය, විද්‍යාව, තාක්ෂණවේදය, විදේශ භාෂා හා විශේෂ අධ්‍යාපන විෂයයන්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ගුරුවරුන් බඳවා ගැනීම - 2023**" යනුවෙන් සඳහන් කළ යුතුය.
vi. එක් අපේක්ෂකයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. අයදුම්කරුවෙකුට එක් විෂයයක් සඳහා පමණක් ඉල්ලුම් කළ හැකි අතර, අයදුම් කරනු ලබන විෂයය කිසිසේත් වෙනස් කරනු නොලබන අතර ඒ පිළිබඳ ඉදිරිපත් කරන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ.
vii. ඉල්ලුම් කිරීමේදී පුරප්පාඩු ලේඛනයෙහි පවත්නා පුරප්පාඩු සඳහා පමණක් අයදුම් කළ යුතු අතර, අයදුම්පතෙහි ඉල්ලුම් කරන විෂයය සහ විෂය කේත අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.
viii. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
ix. අයදුම්පත් ලැබී ඇති බව දන්වනු නොලැබේ.
x. විභාගය සඳහා අයදුම්කරුවන් වෙත විද්‍යුත් තැපැල (E-mail) මඟින් ප්‍රවේශ පත්‍ර නිකුත් කළ විගස ඒ බව සඳහන් කරමින් www.cm.cp.gov.lk වෙබ් අඩවියේ හෝ පුවත්පත් නිවේදනයක් පළ කරනු ලැබේ. මීට අමතරව අයදුම්පතෙහි සඳහන් ජංගම දුරකතනය වෙත මධ්‍ය. රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් SMS මාර්ගයෙන් ද දැනුම් දෙනු ඇත. නිවේදනය පළ වී දින 7 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් මෙම අමාත්‍යාංශය වෙතින් විමසීම් කළ හැකිය.
xi. දැනට රජයේ සේවයේ නියුතු නිලධාරීන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරන ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

04. බඳවා ගැනීමේ ක්‍රමවේදය

i. පවත්වනු ලබන ලිඛිත තරග විභාගයෙන් සමත් අපේක්ෂකයින් අතුරින් ඉහළම ලකුණු ලබා ගන්නා අනුපිළිවෙල අනුව ඒ ඒ විෂයයට අදාළ ගුරු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් යුත් ගුණයක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව පසුව කිසිදු අයුරකින් සලකා බලනු නොලැබේ. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් භාරගනු නොලබන අතර, ඉල්ලා සිටිනු ලබන සියලුම ලිපි ලේඛන සමග සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම අනිවාර්ය වේ.
ii. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.
iii. සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පසුව ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණය ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ "ආ" පරිශිෂ්ටයේ උපදෙස් අනුව පවත්වනු ලැබේ. ඒ පිළිබඳ විස්තර මෙම අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය වන www.cm.cp.gov.lk හි පළකර ඇත.
iv. සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අපේක්ෂකයන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා අනිවාර්යයෙන් ඉදිරිපත් විය යුතු අතර, ලිඛිත විභාගයේ සහ ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණුවල එකතුව අනුව ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් අතරින් එක් එක් විෂයය අනුව පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව අදාළ තනතුරුවලට බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

05. විභාගයට පෙනී සිටීම

i. අයදුම්පත් ඉදිරිපත් කරන ලද සුදුසුකම් සහිත සියලුම අයදුම්කරුවන් වෙත විභාගයට ඉදිරිපත් වීම සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

සැලකිය යුතුයි :

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කළ පමණින් හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවීම හෝ විභාගයට ඉදිරිපත් වීම ඔහුට හෝ ඇයට පත්වීමක් ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

06. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව

සෑම විභාග අපේක්ෂකයෙක්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත අනන්‍යතා සහතිකයක් පමණක් පිළිගනු ඇත.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු රියදුරු බලපත්‍රය

07. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය

මෙම විභාගය "**සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි**" මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. එහිදී සිංහල මාධ්‍යයෙන් ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන්නන් සිංහල මාධ්‍යයෙන් ද, දෙමළ මාධ්‍යයෙන් ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන්නන් දෙමළ මාධ්‍යයෙන් ද, ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන්නන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද විභාගයට ඉදිරිපත් විය යුතුය.

සියලු අපේක්ෂකයන් මෙම සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකින් පමණි. එම භාෂා මාධ්‍යය පත්වීම ලබාදෙන භාෂා මාධ්‍යය වේ.

අයදුම්කරුවෙකු ඉදිරිපත් කරනු ලබන අයදුම්පතෙහි දක්වෙන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ.

08. විෂය නිර්දේශය

මෙම විභාගයට නියමිත ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව දෙකකි. එම ප්‍රශ්න පත්‍ර දෙකම පහත සඳහන් පරිදි බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලින් සමන්විත වේ. සියලුම අයදුම්කරුවන් මෙම ප්‍රශ්න පත්‍ර දෙක සඳහා පෙනී සිටීම අනිවාර්යය වේ. ලිඛිත විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40 බැගින් ලබාගෙන විෂයයන් දෙකම සමත්විය යුතුය.

i. අභියෝගතාව : කාලය පැය 01 යි - ලකුණු 100
අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා සහ තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගත සකස් වූවකි. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.
ii. සාමාන්‍ය දැනීම : කාලය පැය 01 යි - ලකුණු 100
ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා / හෝ දේශීය වශයෙන් සිදුවී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන තවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න වලින් සමන්විතය. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

09. විභාග හා පරිපාලන ගාස්තු

විභාග ගාස්තු රු. 600/- කි. මෙම විභාග ගාස්තුව ආදායම් ශීර්ෂ අංක 20-03-02-13 ට මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම් නමින් මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගන්නා තිල් පැන ලදුපත අයදුම්පත්‍රයේ නියමිත තීරුවේ අලවා එම ලදුපත් අංකය සඳහන් කර එවිය යුතුය.

ඉහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හැර වෙනත් ආයතනවල මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සි හා මුදල් ඇණවුම් හෝ මුදල් නීසිවක් භාර ගනු නොලැබේ. උපදෙස් පරිදි අදාළ ගෙවීම් සිදුකර නොමැති අයදුම්කරුවන්ට විභාගය සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ. කිසිදු හේතුවක් මත ගෙවූ විභාග ගාස්තු නැවත ගෙවීමක් සිදු කරනු නොලැබේ.

10. සේවා කොන්දේසි

රජයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලටද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලටද, ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලටද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (අ) වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

i. උසස්වීම් / සේවා කොන්දේසි මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් 2015.10.09 දිනැතිව අනුමත කරන ලද මධ්‍යම පළාත් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ සිදු කරනු ඇත.
ii. මෙම තනතුරට පත්කරනු ලබන සෑම ගුරු භවතෙක්ම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වේ. මුලින්ම පත්වීම් ලබන පාසලේ වසර 05 ක සේවා කාලයක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. වසර 05 අවසානයේ දී ස්ථාන මාරු ඉල්ලීමට සුදුසුකම් ලබනු ඇත.
iii. මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට පත්වීම් ලාභීන් යටත් විය යුතුය.
iv. 2020.10.16 දිනැති රා.ප.චි. 18/2020 අනුව දෙවෙනි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.
v. වැටුප් පරිමාණය
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව මෙම පත්වීමට හිමි වැටුප් ක්‍රමය අංක ජී-ඊ-1-2016 දරන වැටුප් කාණ්ඩයේ රු. 31,490 - 445 x 6 - 525 x 7 - 600 x 2 - රු. 39,035/- ක් වූ වැටුප් පරිමාණයේ 14 වන පියවරෙහි වැටුප වන රු. 37,835/- මත පිහිටුවනු ලැබේ.

11. විභාගය සියලුම දිස්ත්‍රික්කයන්හි පැවැත්වෙන්නේද නැතහොත් කවර දිස්ත්‍රික්කයන්හි පැවැත්වෙන්නේද යන්න විභාග අපේක්ෂකයින් සංඛ්‍යාව මත මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ඇත.
12. පත්වීම ක්‍රියාත්මක වන දින සිට දින 14 ක් ඇතුළත සේවයට වාර්තා කළ යුතුය. පත්වීම් ලැබූ පාසල වෙනස් කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.
13. අයදුම්පත් භාරගන්නා අවසන් දින සිට ඉදිරි වසරක කාල සීමාවක් තුළ බඳවා ගැනීම සඳහා පමණක් මෙම පුවත්පත් දැන්වීම වලංගු වේ.
14. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වේනොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතියද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය ද මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා සතුය.
15. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

එච්.එම්.එම්.යූ.බී. හේරත්
ලේකම්,
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,
මධ්‍යම පළාත.

2023 අගෝස්තු මස 16 වන දින දීය.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත්‍රය

මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වල පවතින අ.පො.ස. (උසස් පෙළ) ගණිතය, විද්‍යාව, තාක්ෂණවේදය, විදේශ භාෂා හා විශේෂ අධ්‍යාපනය විෂයයන්වල පුරප්පාඩු සඳහා උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීම - 2023

01. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (සිංහල / දෙමළ) :
02. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (උදා. PERERA A.B)
03. මුලකුරු වලින් හැඳින්වෙන නම :
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කයේ නම :
මහනුවර ☐ මාතලේ ☐ නුවරඑළිය ☐
(අදාළ දිස්ත්‍රික්කය ඉදිරියෙහි වූ කොටුවෙහි ✓ යොද සලකුණු කරන්න. අනෙක් කොටු හිස්ව තබන්න)
05. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම :
06. ස්ථිර පදිංචි ග්‍රාම නිලධාරී වසමේ නම හා අංකය :
07. ග්‍රාම නිලධාරී වසමේ පදිංචි කාලය :
08. ස්ථිර පදිංචි ලිපිනය (සිංහල / දෙමළ) :
09. ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි) :
10. දුරකථන අංකය : ජංගම : ස්ථාවර :
11. භාවිතා වන විද්‍යුත් තැපැල් ලිපිනය (E-Mail) :
(විභාග ප්‍රවේශපත්‍රය යොමු කිරීම සඳහා)
12. ජාතික හැඳුනුම්පත් අංකය :
13. උපන් දිනය :
වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐
14. 2023.09.08 දිනට වයස :
අවුරුදු ☐☐☐☐ මාස ☐☐ දින ☐☐
15. ස්ත්‍රී / පුරුෂ භාවය
ස්ත්‍රී ☐ පුරුෂ ☐
(අදාළ කොටුවෙහි ✓ යොද සලකුණු කරන්න. අනෙක් කොටු හිස්ව තබන්න)
16. විවාහක / අවිවාහක බව :
විවාහක ☐ අවිවාහක ☐
(අදාළ කොටුවෙහි ✓ යොද සලකුණු කරන්න. අනෙක් කොටු හිස්ව තබන්න)
17. විභාගයට පෙනී සිටින මාධ්‍ය :
සිංහල ☐ දෙමළ ☐ ඉංග්‍රීසි ☐
(අදාළ කොටුවෙහි ✓ යොද සලකුණු කරන්න. අනෙක් කොටු හිස්ව තබන්න)
18. විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තු වන දිස්ත්‍රික්කය :
මහනුවර ☐ මාතලේ ☐ නුවරඑළිය ☐
(අදාළ කොටුවෙහි ✓ යොද සලකුණු කරන්න. අනෙක් කොටු හිස්ව තබන්න)
19. ආබාධිත පුද්ගලයෙකුද යන වග :
අධ්‍යාපන සුදුසුකම්
20. පුවත්පත් දැන්වීමේ සඳහන් කර ඇති විෂයයන් අතරින්
ඉල්ලුම් කරන විෂය :
විෂය කේත අංකය :
(පුරප්පාඩු ලැයිස්තුවේ සඳහන් පරිදි)
21. උපාධියේ නම :
22. නිකුත් කළ විශ්වවිද්‍යාලය :
23. උපාධිය විලංගු දිනය :
අ.පො.ස. (සා/පෙළ) විභාග ප්‍රතිඵල
24. විභාග අංකය :
25. විභාගයට ඉදිරිපත් වූ වර්ෂය :
26. විභාග ප්‍රතිඵල

අනු අංකය	විෂයයන්	ලබා ඇති සාමාර්ථ	අනු අංකය	විෂයයන්	ලබා ඇති සාමාර්ථ
1			6		
2			7		
3			8		
4			9		
5			10		

අ.පො.ස. (උ/පෙළ) විභාග ප්‍රතිඵල
27. විභාග අංකය :
28. විභාගයට ඉදිරිපත් වූ වර්ෂය :
29. විභාග ප්‍රතිඵල

අනු අංකය	විෂයයන්	ලබා ඇති සාමාර්ථ
1		
2		
3		
4		

30. ගෙවා ඇති විභාග ගාස්තුව රුපියල් (අකුරින්) :
31. කුවිතාන්සියේ අංකය :
32. නිකුත් කළ කාර්යාලය :
33. දිනය :

මුදල් කුවිතාන්සිය මෙහි අලවන්න

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරා ගනු ලැබීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මම දනිමි. තවද විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිරීම තොරතුරක් පසුව වෙනස් නොකරමි.

....
දිනය අත්සන

34. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .... පුත්‍ර / මහතා / මහත්මිය / මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවද, ඔහු / ඇය මා ඉදිරිපිටදී .... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

....
දිනය සහතික කරන නිලධාරීගේ අත්සන සහ නිල මුද්‍රාව

සහතික කරන නිලධාරියාගේ නම :
තනතුර :
ලිපිනය :

35. අයදුම්කරු මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය .... පුත්‍ර / මහතා / මහත්මිය / මෙනවිය ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු / ඇය මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ස්ථිර / තාවකාලික / අභ්‍යාසලාභී / අනියම් නිලධාරියෙක් / නිලධාරිනී වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය සේවයෙන් නිදහස් කළ හැකි / නොහැකි බවත් දන්වමි. (අනවශ්‍ය වචන කපා හරින්න)

....
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ
බලය පවරනු ලබන නිලධාරියාගේ
අත්සන සහ නිල මුද්‍රාව

දිනය :
තනතුර :
අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :